# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1953/27 - 2016 පෙබරවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2016.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම රෙගුලාසි 2016 අංක 01 දරන ආනයන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙම රෙගුලාසි 2016 මැයි මස 01 වැනි දා සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. මෙහි 1(අ) උපලේඛනයේ III වන තීරයේ සඳහන් කර ඇති භාණ්ඩ, එම උපලේඛනයේ IV වන තීරයේ අනුරූප සටහනේ සඳහන් සහ අංක 1(අ)(i) දරන උපලේඛනයෙන් විස්තර කර ඇති ප්‍රමිතීන්ට අනුකූල වන්නේ නම් මිස කිසිම ආනයනකරුවෙකු එම භාණ්ඩ ආනයනය කරනු නොලැබිය යුතු ය.

3. පූර්ව සුදුසුකම් තිබීම
අංක 1(අ) උපලේඛනයේ සඳහන් භාණ්ඩ ආනයනය කිරීමට අදහස් කරනු ලබන සෑම ආනයනකරුවෙක්ම ඒ බව ආනයනය කිරීමට අදහස් කරනු ලබන භාණ්ඩ නිෂ්පාදන පිරිවිතර සමඟ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දිය යුතු ය.


1A - G 2835 — 556 (2016/02)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එම භාණ්ඩ නිෂ්පාදන පිරිවිතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ දී අංක 1 (අ) උපලේඛනයේ IV තීරයේ සඳහන් සහ අංක 1 (අ)(i) උපලේඛනයේ විස්තර කර ඇති ප්‍රමිතීන්ට අනුකූල දැයි පරීක්‍ෂා කළ යුතු ය.

එම භාණ්ඩ නිෂ්පාදන පිරිවිතර අදාළ ප්‍රමිතීන්ට අනුකූල වන්නේ නම් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආනයනකරුට එම භාණ්ඩ ආනයනය කිරීම සඳහා පෙර සුදුසුකම් ලත් අයෙකු ලෙස ලියාපදිංචි කිරීමක් කළ යුතු ය.

4. එසේ පූර්ව සුදුසුකම් සම්පූර්ණ වූ විට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, ආනයනකරුට අදාළ භාණ්ඩ(ය) ආනයනය කිරීමට අවසර දෙනු ලැබේ.

4.1 ආනයනකරු විසින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන එක් එක් භාණ්ඩ සඳහාම, මෙහි 1(අ) උපලේඛනයේ (IV) වන තීරයේ අනුරූප ප්‍රමිතිවලට අනුකූල වන බවට පිළිගත් ප්‍රතීතකරණ රසායනාගාරයක් විසින් නිකුත් කරනු ලබන අනුකූලතා සහතිකයක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ; හෝ

4.2 නිෂ්පාදකයා විසින් භාණ්ඩ(ය) සඳහා වෙනත් ප්‍රමිතීන්ට අනුව අනුකූලතා සහතිකයක් ලබා ගෙන ඇත්නම්, එය පිළිගත හැකි සහතිකයක් ලෙස සලකා බැලීමට, එම අනුකූලතා සහතිකය නිකුත් කිරීම සඳහා භාවිත කළ ප්‍රමිතිය උපලේඛනවල සඳහන් අදාළ ප්‍රමිතිය සමඟ අනුකූල වන බවට ආනයනකරු විසින් තහවුරු කළ යුතු ය.

4.3 ආනයනකරු ආනයනය කරනු ලබන භාණ්ඩ(ය) සඳහා එවැනි ඉහත කී සහතිකයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් එම භාණ්ඩ(ය) රේගු නිශ්කාශනය කිරීමට අවසර දෙනු නොලැබේ.

5. මෙම නියෝග යටතේ ආවරණය වන භාණ්ඩ(ය) උපලේඛන 1(අ) සහ උපලේඛන 1(අ)(i) ප්‍රමිතිවලට අනුකූලව තක්සේරු කරනු ලැබිය යුත්තේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන අනුකූලතාවය තක්සේරු කිරීමේ අදාළ කාර්ය පටිපාටි සහ මාර්ගෝපදේශ පදනම් කරගෙනය.

6. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආනයනකරුවෙකුට අනුමැතිය ලබා දී ඇත්නම් මිස මෙම නියෝගය යටතේ ආවරණය වන භාණ්ඩ කිසිම ආනයනකරුවෙකු විසින්, ආනයනය, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, භාවිතය හෝ බෙදා හැරීම නොකළ යුතු ය.

7. මෙහි උපලේඛන 1(අ)සහ 1(අ) (i)හි සඳහන් ප්‍රමිතිවලට අනුකූල නොවන බවට තීරණය කරනු ලැබූ අවස්ථාවක, එම ප්‍රමිතිවලට අනුකූල වන පරිදි අධීක්‍ෂණය යටතේ එම භාණ්ඩ නැවත සකස් කිරීම සඳහා අවසර දීමට හෝ එම භාණ්ඩ අපනයනය කරනු ලැබූ රටේ විකුණුම්කරු වෙත ආපසු යැවීම සඳහා අවසර දීමට හෝ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාර අධ්‍යක්ෂ විමසා සුදුසු ආකාරයට එම භාණ්ඩ බැහැර කරන ලෙස නියෝග කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය තිබිය යුතු ය.

උපලේඛණය 1(අ)

| I - තීරුව අනුක්‍රමික අංකය | II - තීරුව සංයෝජිත වර්ගීකරණ අංක | III - තීරුව භාණ්ඩ විස්තරය | IV - තීරුව ප්‍රමිති ලේඛණය |
|---|---|---|---|
| 01 | 84.81 | **පීඩනය අඩුකි රීමේ කපාට සහ උෂ්ණත්වය වෙනස් වීම මත පාලනය වන කපාට ඇතුළු පයිප්ප, බොයිලේරු, කසු ටැංකි, වැට් හෝ එවැනි දේ සඳහා අත් කරාම, කරාම, කපාට සහ සමාන උපයෝගී උපකරණ** | |
| | 8481.80 | අනෙකුත් උපයෝගී උපකරණ | |
| | 8481.80.10 | ජල ටැංකි සඳහා තඹ ලෝහ වලින් බඳ නිම වූ, ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන පිස්ටන් (තෙරපුම් කුට්ටි) වර්ගයේ කපාට | BS1212-1:1990 |
| | 8481.80.20 | ජල ටැංකි සඳහා තඹ ලෝහ වලින් බඳ නිම වූ, ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන ඩයෆ්‍රම් (ප්‍රාචීරපෙති) වර්ගයේ කපාට | BS1212-2:1990 |
| | 8481.80.30 | ජල ටැංකි සඳහා ප්ලාස්ටික් වලින් නිම වූ, ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන ඩයෆ්‍රම් (ප්‍රාචීරපෙති) වර්ගයේ කපාට | BS1212-3:1990 |
| | 8481.80.90 | අනෙකුත් | |
| | 8481.90 | කොටස් | |
| | 8481.90.10 | වැසිකිළි-කැසිකිළි, ජල ටැංකි සඳහා සියලු කොටස් ප්ලාස්ටික් වලින් නිම වූ, ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන සංයුක්ත ඒකක කපාට | BS1212-4:1991 |
| | 8481.90.20 | ජල ටැංකි සඳහා ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට වල තඹ ලෝහ වලින් නිම වූ කපාට බඳ | BS1212-1:1990 සහ BS1212-2:1990 |
| | 8481.90.30 | ජල ටැංකි සඳහා ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට වල ප්ලාස්ටික් කොටස් | BS1212-1:1990 BS1212-2:1990 BS1212-3:1990 සහ BS1212-4:1991 |
| | 8481.90.90 | අනෙකුත් | |

## උපලේඛණය 1(අ) (i)

ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන ජල කපාට සහ ඒවායේ අමතර කොටස් සඳහා බ්‍රිතාන්‍ය ප්‍රමිති ලේඛන

01. තඹ මිශ්‍ර ලෝහ වලින් බඳ නිම වූ, ඉපිලෙනයක් මගින් ක්‍රියාකරන පිස්ටන් වර්ගයේ ජල කපාට (ඉපිලෙනය රහිත)

**ප්‍රමිති ලේඛනය: BS1212-1-1990:**

වර්ගීකරණය 1 - ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට. **පිස්ටන වර්ගයේ ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට (තඹ මිශ්‍ර ලෝහ වලින් බඳ නිම වූ) (ඉපිලෙනය රහිත) සඳහා නිමි විස්තර**

02. තඹ මිශ්‍ර ලෝහ වලින් බඳ නිම වූ, ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන ප්‍රාචීර වර්ගයේ කපාට (ඉපිලෙනය රහිත)

**ප්‍රමිති ලේඛනය: BS1212-2-1990:**

වර්ගීකරණය 2 - ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට .**ප්‍රාචීර වර්ගයේ ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට (තඹ මිශ්‍ර ලෝහ වලින් බඳ නිමවූ) (ඉපිලෙනයරහිත) සඳහා නිමි විස්තර**

03. ප්ලාස්ටික් වලින් බඳ නිම වූ, ඉපිලෙනයක් මගින් ක්‍රියාකරන ප්‍රාචීර වර්ගයේ කපාට

**ප්‍රමිති ලේඛනය: BS1212-3-1990:**

වර්ගීකරණය 3 - ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට. **පයිප්ප ජලය සඳහා ප්‍රාචීරවර්ගයේ ඉපිලනයක් මගින් ක්‍රියා කරන කපාට (ප්ලාස්ටික් වලින් බඳ නිමවූ) (ඉපිලෙනයරහිත) සඳහා නිමි විස්තර**

04. වැසිකිළි හා කැසිකිළි පෝච්චි සෝදන ටැංකි සඳහා ප්ලාස්ටික්, සංක්ෂිප්ත වර්ගයේ ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට

**ප්‍රමිතිලේඛනය: BS1212-4-1991:**

වර්ගීකරණය 3 - ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට .**වැසිකිළි හා කැසිකිළි පෝච්චි සෝදන ටැංකි සඳහා ප්ලාස්ටික්, සංක්ෂිප්ත වර්ගයේ ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට(ඉපිලෙනය සහිත) සඳහා නිමි විස්තර**

05. ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාටය සඳහා ප්ලාස්ටික් බෝලය

**ප්‍රමිතිලේඛනය: BS2456:1990:**

**පයිප්ප ජලය සඳහා ඉපිලෙනයක් මගින් ක්‍රියා කරන කපාට වල ප්ලාස්ටික් බෝලයේ නිමි විස්තර**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.